### 11 වන පිටුවෙන් (තනතුරට අනතුරුව ?)

11 වන පිටුවෙන්

රටට කළ සේවයට කිසිවෙකු විසින් සමච්චලයට ලක්කිරීම කෙතරම් සාධාරණද? හමුදාපති, නාවික හමුදාපති සහ යම්තාක් දුරට ගුවන් හමුදාපති අතරත් නයි පොළොඟුන් මෙන් වැඩ කටයුතු සිදු වන විට ගොයා ඒ සියල්ල කළමනාකරණය කළ ආකාරය තුළින් ඔහුගේ ශූරතාව ගැන යමෙකුට නොතේරේ නම් කුමක් කරන්නද? එබඳු සංදර්භයක් තිබුණු බවට ජනතාවට එකල එතරම් නොදැනීමෙන්ම ඔහු එය කෙතරම් හොඳින් කළාද යන්නට හොඳම සාක්ෂිය වන්නේය. බැසිල් ඉන්දියාව අවනත කර ගත්තේය. මහින්ද අයෝමය ඉන්ද්‍රකීලයක් මෙන් නැගී සිට තමන්ට නොව රටට එරෙහි වූ සියලුම බලවේග වලට මුහුණ දුන්නේය. රනිල් හෝ චන්ද්‍රිකා මෙබඳු අවස්ථ ාවකදී කෙසේ කටයුතු කරණු ඇත්දැයි විමසා බලන්න. මෙයටත් වඩා සැබෑ සාමූහික ප්‍රයත්නයක් ගැන නිදසුන් කොයින්ද? මේ කිසිවෙකු අති දක්ෂ කතිකයෝ නොවෙති. එහෙත් රනිල් මෙන් අදක්ෂ කථිකයෙක්ද නොවෙති. රටක්, සමාජයක් ජනතාවක් එකම පවුළකින් මෙවැනි සපිරි සම්පත් ලැබීමට පින් කර තිබිය යුතුයැයි පැවසීම මුසාවක් විය හැකිද? අන් සමාගමකින් කරගත නොහැකි වූ කර්තව්‍යයක් සහෝදර සමාගමකින් හෝ කරගැනීමෙහි ඇත්තේ කවර වරදද?

සීගිරි කැටපත් පවුරේ කුරුටු ගීයක් ලියූ ගැමියෙක් සීගිරියේ උරුමය තමන්ට පවරා ගනී නම් එය ඔහුගේම අනුවන කම මිස අන් කවරක්ද? තමන් පෙළහර පාන සංදර්භය තුළ වීරයෙකු වූ පමණින් ඔහු සමස්ථය හැසිරවීමේ දක්ෂයෙක් නොවන වග අප විසින් අපටම කියා දිය යුතු පාඩමකි. කොන්දොස්තොර වූ පමණින් දොස්තරකමට නුසුදුසු වන්නාක් මෙනි. තම තමන්ගේ සීමා මායිම් ගැන අවබෝධයක් තිබීම කෙනෙකුට යහපත් මිනිසෙකු මෙන් තමන්ගෙ න් සමාජයට ඉටුවිය යුතු යුතුකමක් වෙයිද එය නොපිරිහෙළා ඉටුකිරීමට හේතු වෙයි. තමන්ගේ වපසරිය නොදන්නාකමින් ඔවුන් තමන්ටත්, මුළු මහත් සමාජයටත් කලු පැල්ලමක් සහ අසීමිත කරදරයක්ද ඇති කරයි. වැසිකිලි ශෝධකයා-ගේ පටන් ජනාධිපති දක්වාම දිවෙන වගකීම් සමූදායන් තුළ සිටිය යුත්තේ යහපත් මනුෂ්‍යයෙකු මිස දෙකට තුනට නැමෙන හෝ නොනැමෙන පඹයින් නොවේ.

ශූර නායකයා විශ්‍රාම ගිය පසු ඔහු ගිය මඟ සළකුණුද කාලයේ වැලි තලාවෙන් යටවීම හෝ යට නොවීම ගැන අකම්පිත වෙයි. මක්නිසාද යත් එය ලෝකස්වභාවය බව ස්වකීම බුද්ධියෙන්ම ඔහු දත් නියාවෙනි. සමාජ සේවය පිණිස දේශපාලනයට එන සියලු දෙනාම ඉතා ඕනෑකමින් අධ්‍යයනය කළ යුතු චරිතයක් අප රටේ දේශපාලන වංශකතාවේ වෙයි. එහෙත් බොහෝ දෙනෙකුට ඔහු ගැන මතකයක් නැති තරම්ය. තිබුණත් ඔහුට අවශ්‍ය තිසි ගෞරවය දීමට තරම් නිහතමානී කමක් නොමැත. මෙම චරිතය තනතුරු පසු පස බලෙන් පන්නාගෙන නො-ගියේය. එහෙත් තමාගේ ගමට සේවය කළේය. සතුරන්ගෙන් පළි නොගත්තේය. ඒ වෙනුවට ඔවුන්ටද රැකියා ලබා දුන්නේය. අප දන්නා පරිදි ඔහු කළ ලොකුම වරද තමාගේ ගමේ එකාට තැන නොතැන නොබලා රැකියා ලබාදීම පමණි. කෙසේ වෙතත් ඒ පිනෙන්දෝ තනතුරු ඔහු පසුපස හඹා ආවේය. අවසාන වශයෙන් ඔහුට රජකමද ඉබේම ලැබුණි. කෙටි කාලයක් ජනාධිපති පදවිය දැරූ ඔහු ත්‍රස්තවාදියා ත්‍රස්තවාදියා බව කෙළින්ම කීවේය. මුළු නැගෙනහිර පළාතම කොටින්ගෙන් බේරා ගත්තේය. තවත් වසර දෙකක් ඔහු බලයේ සිටියේ නම් මහින්දට දිනන්නට යුද්ධයක් පවා නොතිබීමට ඉඩ තිබුණි.

ඔහු සිවිල් ජන සමාජය වසාගෙන පැතිර තිබූ භීෂණයේ අඳුරු හෙවනැළි ඉවත් කර දැමුවේය. සාධාරණ මැතිවරණයක් පවත්වා අවසානයේ අවිහිංසක මිනිසෙකු ලෙසින් තමා උපන් ගමේ නිවසට වී ජීවිතය අවසන් වන තුරු සියලු බර බිමින් තබා කාලය ගත කළේය. ඉන්පසුව පැමිණි නායිකාව රටේ දූෂණය, භීෂණය නැති කළේ තමා බව අදටත් කියයි. මිනිස්සු එවා අසයි. ඇතැම්විට අදහයි. ලාඕට්ෂේගේ කවියේ සිටින සොඳුරු පාලකයා අසලට කිට්ටු වූ නායකයෙක් ලෙස පෙනී යන්නේ ඩී. බී විජේතුංගයෝය. ඔහු කළ දේවල් කළාදැයි අදටත් ජනතාවට නොදැනෙන සේය. ඔහු කළ දේවල් වේදිකාවල වමාරා කෑ අයුරුද එතරම් මතකයක් නැත. ඔහු එතරම්ම සියුම් චරිතයකි. ජනවිඥානය පවා විනිවිද යන එබඳු චරිතයෝ අතිශ්‍යයින්ම දුබලහ. මරණාධාර සමිතියේ පටන් රටේ නායකත්වය දක්වා සටන් වදින සියලු පුද්ගලයෝ මෙබඳු චරිත මතුපිටින් නොව ගැඹුරින් අධ්‍යයනය කිරීමට තරම් වටනේය. තනතුරු බදා ගැනීමට වඩා හැරදැමීමට නායකයෝ පුරුදු පුහුණු විය යුත්තෝය. විශේෂයෙන් දූසින් ගණන් වාර වලදීත් තමාව ප්‍රතික්ෂේප කළත් රනිල්ට තවමත් තමන් කවුදැයි වටහා ගැනීමට නොහැකිව ඇත. රනිල්ට තනතුරු අතහැරීමට නොසිතීමට හේතු වන කරුණු දෙකක් තිබේ. එකක් ශ්‍රී ලංකාව දියුණු කිරීමට ඇති කැමැත්තය. නැතිනම් ශ්‍රී ලංකාව විනාශ කිරීමට ඇති කැමැත්ත විය හැකිය. මේ කරුණු දෙකෙන් එකක් පමණක් අනිවාර්යයෙන්ම සත්‍ය විය යුතුය.

1996 ලෝක ක්‍රිකට් කුසලානය පිටුපස සිටි අයෝමය හස්තයකි, අනා පුංචිහේවා මහතා. එහෙත් සාධාරණ නොවූ බල පොරයක් ඉදිරියේ ඔහු තමාගේ තනතුරට ආයුබෝවන් කියා ගෙදර ගියේය. ශ්‍රී ලංකාව වසර 1996 ලෝක කුසලානය ලබාගන්නා අයුරුද ඔහු නිසොල්මනේ බලා සිටියේය. ලෝක කුසලානය දිනූ පසුව ආනා ගැන මතකයක් තිබුණේ කීයෙන් කී දෙනාටද? ඔහු තමාගේ කොටස ඉටුකර යන්නට ගියේය. සැබවින්ම කේක් ගෙඩියේ රස දත් පිරිසක් කේක් ගෙඩිය පිසූ කෝකියා නෙරපා දැමීමට කටයුතු කළේය. ආනා තාමා ගැන මතකය පුම්බන්නටද නොගියේය. කිසිවෙකු ඒ වෙනුවෙන් පත් කිරීමටද නොගියේය. නායකත්වය හෝ මෙහෙය වීම උරුම විය යුතුව ඇත්තේ එබඳු අයටය.

අර්ජුන හොඳ ක්‍රිකට් නායකයෙකි. ඔහු පිටියේදී සියලු බර තමන් පිටට ගත්තේය. පරාජය පෙනි පෙනී සිටියද ඔහු ලකුණ ලකුණ ඇවිද ගොස් ප්‍රතිවාදීයා පීඩාවට පත් කළේය. එහෙත් ඔහු ක්‍රිකට් පිටියේ පෑ ඉවසීම, සංයමය දේශපාලනය තුළ දක්වනු ලබන්නේද? ක්‍රිකට් නායකත්වය දේශපාලන නායකත්වයට ආභරණයක් කරගැනීමට යාමෙන් අර්ජුණ රණතුංග නම් ප්‍රතිරූපය දෙදරා දමන්නේද ඔහු විසින්මය. යම් හෙයකින් ඔහු අපේක්ෂා කරන සාධාරණ ක්‍රීඩා පරිපාලනය කරා යා හැකි මගක්ද තිබේ. ඒ ඔහු එදා පිටියේදී ලකුණ ලකුණ ඇවිද යාමේදී දැක්වූ සංයමය සහ මහත්මා ගතිය දේශපාලනය නම් වූ යාන්ත්‍රණය තුළ ක්‍රියාත්මක කළ හැකි ආකාරය තේරුම් ගැනීමය. පළිගැනීමේ චේතනාව පෙරදැරි කරගෙන යා හැකි දුර කෙටිය - අප්‍රසන්නය.

හමුදාවක් පාලනය කළ යුත්තේ දැඩි විනයක් යටතේය. එහිදී නායකත්වය දැරිය යුත්තේ ජනරාල් සරත් ෆොන්සේකා හෝ රංජන් විජේරත්න වැනි අයෙකි. ඔවුන් තුළ නිසඟයෙන් පවත්නා දෘඪ පෞරුෂ්‍යය තම අණ ක්‍රියාත්මක කරවීමේහිලා අතිශයින්ම උපකාරී වේ. ජනතාව යනු හමුදා භටයා පාලනය කළ යුතු පරිදි පාලනය කළ යුත්තෝ නොවෙති. සරත් ෆොන්සේකා යනු ලෝකයේ අද සිටින, අති දක්ෂ හමුදා නායකයෙක් බව අවිවාදිතය. ඔහු වසර හතළිහක් ජීවත් වුනේ එබඳු වටපිටාවක මිස මහින්ද මෙන් ජනතාව අතර නොවේ. ඇතැම් විට බාහිර සහ අදිසි හස්තයන් මත ඔහු රටේ මීළඟ නායකයා බවට පත් වූවා යැයි සිතමු. එකල්හි ජනතාවට නව නායකයෙකු ලැබෙනු ඇත. රටට උසස් විනයක්ද ලැබෙනු ඇතැයි උපකල්පනය කළ හැකිය. එහෙත් ඒ කරා යාමේදී සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රධානම සතුරන් වෙනු ඇත්තේ සහෝදර සමාගම නොව සැමදාම තම තරමත්, චර්යාවත් වරදවා තේරුම් ගෙන සිටින අදූරදර්ශී ජනතා විමුක්ති පෙරමුන්, රටේ පොදු ජනතාවගේ හද ගැහෙන රාවය ගැන කිසිඳු අවබෝධයක් නැති වත්මන් එක්සත් ජාතික පක්ෂ නායකත්වය සහ ඊට මුක්කු ගසන ශ්‍රී ලංකා මහජන පාර්ශවය බඳු කසිකබල් පක්ෂ වීමට බොහෝ ඉඩ තිබේ.

සියල්ල අවසානයේ ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ යුද්ධය දිනුවේ තමන් නිසා බවය. රනිල් පවසන්නේ තමන් නිසා බවය. ජනතාව සියලු බර නොඉසුලුවේ නම් යුද්ධය නොදිනන බව බහු ජන මතය විය හැකිය. සියල්ල අවසානයේ මහින්ද කිසිවක් නොකළ නායකයෙක් බව යම් අයෙකුට පෙනී යා නම් එය සත්‍යයක් විය හැකිද? ජයග්‍රහණ ඉදිරියේ ව්‍යාජ පියවරු පැටව් ගසති. සැබෑ පියා සැඟවෙයි. සත්‍ය කාලයාගේ ඇවෑමෙන් ප්‍රබන්ධයන් බවට පත්වේ. ප්‍රබන්ධ මිත්‍යාවන් වේ. එබැවින් මිත්‍යාවන් තුළ සත්‍යද, සත්‍ය තුළ මිත්‍යාවද ඇති බව අපට දැනේ - සහ හැඟේ.

අවසාන වශයෙන් ලාඕට්ෂේ නැවතත් මතකයට නැගේ.....

සූර නායක තෙමේ අඩුවෙන් දොඩති
අපරික්සාවෙන්ද නොදොඩති
තමා වෙනුවෙන්ම මතු කටයුතුද නොකරයි
යන කලෙක කිසිවක්ම නොපතයි
ගිය තැන සළකුණුද නොම වෙයි
සියල්ල සිදුවී අහවර වූ සඳ
ජනයා මෙසේ පවසනු ඇත
"හැම දේම කළේ අපියි"

YSL
Migration Services

MIGRATION
SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: 03 8794 9818 | 03 8794 9297 :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF
MIGRATION INSTITUTE
OF AUSTRALIA